# TONSILLECTOMY

1. ඔබගේ දරුවාගේ සෙම්ගෙඩි ශල්‍යකර්මයකින් ඉවත්කල යුතුය.
   ශල්‍යකර්මය සෙම්ගෙඩි ආසාදනයක් පවතිනවිට සිදුකරන්නේ නැත.

2. සෙම්ගෙඩි ඉවත් කරන්නේ මුඛය තුලිනි.
   බෙල්ලේ සැත්කමක් කිරීමට අවශ්‍ය නැත.

3. සැත්කමට පසු රුධිරය වහනය වීමේ අවදානමක් ඇති බැවින් පැය 24ක් රෝහලේ සිටිය යුතුය.

4. වේදනාව තිබෙන නමුත් නිතරම දියර වර්ග පානය කලයුතුය.
   බත්, පාන්, ඉඳිආප්ප වැනි ඕනෑම ආහාරයක් ගතහැක.
   නිතර ආහාර හා දියර වර්ග ගැනීමෙන් තුවාලය ඉක්මනින් සුවවේ. ආහාර වේලට පැය ½ට පෙර ඔබට දී ඇති වේදනා නාශක පාවිච්චි කරන්න.

5. සැත්කමින් පසු සති 2ක් ගෙදරට වී සිටිය යුතුය.
   සෙනග ගැවසෙන ස්ථානවලට යාමෙන් ඔබගේ මුඛයේ තුවාලය ආසාදනය වියහැක.